රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 02/2002

මගේ අංකය : 1/සීඊ/02-6
රාජ්‍ය පරිපාලන, කළමණාකරණ හා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2002.06.12

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් සභා යටතේ වන රාජ්‍ය ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා
රාජ්‍ය - පෞද්ගලික සමාගම් ප්‍රධානීන් වෙත.

## රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 2002

වර්ෂ හතරකට වරක් පවත්වනු ලබන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ මීළඟ සංගණනය 2002 ජූලි මස 01 වන දින පැවැත්වීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් විධි විධාන යොදනු ලැබ ඇත. මෙය මෙම සංගණන මාලාවේ නව වැන්නයි.

02. මෙම සංගණනයට, මධ්‍යම රජය යටතේ පවත්නා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා, අධිකාරි සහ රාජ්‍ය-පෞද්ගලික සමාගම්හි ද, පළාත් සභා යටතේ පවත්නා රාජ්‍ය ආයතනයන්හි ද (පළාත් පාලන ආයතන ද ඇතුලුව) සේවයේ නියුක්ත ස්ථිර, අනියම්, තාවකාලික සහ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සෑම තරාතිරකමකටම අයත් සේවා නියුක්තිකයින් ඇතුලත් විය යුතු වේ. අදාල ආකෘති පත්‍ර සේවා නියුක්තිකයින් විසින් පෞද්ගලිකවම සම්පූර්ණ කොට තොරතුරු සැපයීම අවශ්‍ය වේ.

03. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, සංගණන ආකෘති පත්‍ර අදාල අමාත්‍යාංශයේ හෝ පළාත් සභාවේ සම්බන්ධීකරණ නිලධාරී මගින් සේවා නියුක්තිකයින් වෙත සපයනු ඇත. මේ සම්බන්ධයෙන්

- ආයතනයේ සියලුම සේවා නියුක්තිකයින් වෙත ආකෘති පත්‍ර බෙදදීම,
- සම්පූර්ණ කරන ලද අකෘති පත්‍ර ඔවුන්ගෙන් ආපසු ලබාගැනීම,
- සේවා නියුක්තිකයින් සියලුම දෙනා විසින් සම්පූර්ණයෙන් සහ නිවැරදිව එම අකෘති පත්‍ර පුරවා තිබේදැයි පරීක්ෂා කොට බැලීම,
- සම්පූර්ණ කරන ලද අකෘති පත්‍ර 2002 ජූලි මස 15 දින වන විට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ආපසු එවීම යන කරුණු සිදු කළ යුතුව ඇත.

04. මෙම සංගණනයෙන් ලබා ගන්නා දත්ත හා තොරතුරු ඉදිරි සැළසුම් සකස් කිරීමෙහි ලා රජයටත්, වෙනත් ආයතනවලටත් ඉතා ප්‍රයෝජනවත් වේ. එහෙයින් ඉහත කී කාර්යයන් නිසි අයුරු ඉටු කර ගැනීමට සහ ඔබ ආයතනයේ සියලුම සේවා නියුක්තිකයින් ගේ තොරතුරු සම්පූර්ණව ලබා ගැනීමට අවශ්‍ය විධි විධාන යෙදීමෙන්, සංගණනය සාර්ථක කර ගැනීමට සහයෝගය දක්වන ලෙස මම ඔබගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි.

ඩීටා විමලසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන. කළමණාකරණ හා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය